සරත් සිල්වා මැතිඳුන් කළ හදියක මහත.........!

උසාවිය මැදිහත්වීම තුළින් ගුරු සටන කඩාකප්පල් කිරීම අළුත්ම තත්වයක් මේ රට තුළ ඇති කරනවා. සාමාන්‍යයෙන් මහ උසාවිය කරන්නේ විධායක තීන්දු ගැන සොයා බලා ඒවා මිනිස් අයිතීන් ආරක්ෂා කරනවාදැයි සොයා බැලීමයි. මෙතැනදී පුරවැසියන් සමූහයක් ගත් ක්‍රියාමාර්ගයක් ගැන මානව අයිතීන් පදනමේ තීන්දුවක් දීමට ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපත් වෙලා. මේක අළුත්ම තත්වයක්. රජය විසින් ගන්නා පියවරවලින් වන මානව හිමිකම් කඩවීම් ගැන පමණක් සොයා බලන අධිකරණය පුද්ගලයන් හෝ පුද්ගලික ආයතන කරන මානව හිමිකම් අපරාධ නීතිය තුළින් ගත යුතු බවට ඇඟවීමක් තිබුණා. ව්‍යවස්ථාව අනුව මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් වන්නේ රජයේ ඉහළ නිළධරයන් හා ඔවුන්ගේ ඒජන්තයන් පමණයි. මේ සිද්ධියේදී රජය සමඟ ගැටෙන වෘත්තීය සමිති වගඋත්තරකරුවන් වෙන්නේ කොහොමද කියන එක ප්‍රශ්නයක්. මෙතැනදී පළමු වැනි වගඋත්තරකරු විභාග කොමසාරිස්මයි. ගුරුවරුන් ඔහු යටතේ සිටින නිළධාරීන් නොවෙයි. ඔවුන් ඔහුට හවුල් වෙන්නේ ස්ව කැමැත්තෙන් ඇති කරගන්නා ගිවිසුමක් තුළින්. එහෙම නම් එම ගිවිසුම අනුව එම පරීක්ෂණ නිළධාරීන් කොමසාරිස්ගේ වගකීමට බැඳෙනවා නම් ඒ අය වෙන වෙනම වගඋත්තරකරුවන් විය යුතුයි. එහෙම නැතිව පොදු ගුරු සංගම් වගඋත්තරකරුවන් කර එහි සභාපතිවරු වගඋත්තරකරුවන් කළේ මොන නීතිය යටතේද?

දැන් සිදු වී තිබෙන්නේ විධායකය හා ව්‍යාවස්ථාදායකය ඉක්මවා උසාවිය රට පාලනය කිරීම නැත්නම් මර්ධන දියත් කිරීම තම අත යටතට ගැනීමයි. මේ නව තීන්දුව අනුව කිසිම රජයේ සේවකයෙකුට තම සේවය අත්හිටුවා වැඩවර්ජනයකට සහභාගී වෙන්නට බෑ. මොකද? ඕනෑම රජයේ සේවයකින් ජනතාවට සේවයක් වන නිසාත්, එම සේවය අඩපණ කිරීමෙන් ජන කොටසකගේ එම සේවය භුක්ති විඳීමේ අයිතිය නැතිවන නිසාත්ය. මේ අනුව රජයේ සේවකයින්ට වෘත්තීය සටන් ක්‍රියාමාර්ග අනුගමනය කරන්නට බැරිය. දැන් ලංකාව ගමන් කරන්නේ 1912 දුම්රිය වැඩ වර්ජනය යුගයේ සුද්දන්ගේ නීතිය යටතටයි. එදා සුදු පාලකයින් කීවේද රජයේ සේවකයින්ට වෘත්තීය සමිති ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට නොහැකි බවයි. අඩු තරමේ එදා රජයේ සේවකයෙක් වීම ලොකු තානාන්තරයක් හා වරප්‍රසාදයක් ලෙස තිබුණා. හැම රජයේ සේවකයෙකුටම නිළ ඇඳුමක් සමඟ ආනුභාවයක් ඈතුල් කරලා තිබුණා. රැජිනගේ මහා සේවයේ යෙදෙන රාජ නිළධාරියෙක් කියන පම්පෝරි අමුණල තිබුණා. රජයේ සේවකයා ගැන පොලිසි, උසාවි පවා බැළුවේ වෙනස් විදියකට. ඒත් මේ රාජ උෂ්ණය දැන් නැත. එහෙත් එදා තිබුණ වහල්භාවය යළි ඇති කර ඇත. මේ ගැන නම් සරත් සිල්වා මැතිඳුන්ට මහත්ඵල මහා ආනිශංස ලැබෙනවාට සැක නැත. බුද්ධ පුත්‍රයන්ටත් වඩා හොඳින් බණ දේශනා කරන මහා නඩුකාර උණ්නාන්සේ අපට කළ හදියක මහත.

තවම නඩුව ඉවර නැත. එය ඉදිරියේදී කථා කරනු ඇත. මේ නඩුවට නිතිඥ සේවය ඉල්ලා ජාත්‍යාන්තර කම්කරු සම්මේලනවලට කියන්න තරම් ප්‍රශ්නයක් ඇතිවෙලා තියෙනව. එසේම රාජ්‍ය සේවයේ සියළු වෘත්තීය සමිති එකම පොදියකට ඇවිත් මේ බියකරු තර්ජනයට මුහුණ දෙන්නට වෙනව. විශේෂයෙන් තම වෘත්තීය හයිය තුළ සැහෙන සටන් ජයගත් දොස්තර මහත්වරුන් පවා දැන් සිහි කල්පනාවෙන් මේ ගැන විමසිය යුතුයි. සමහර ප්‍රබුද්ධ දොස්තර සංගම් නායකයින් මේ ගැන විමසන්නට පටන් අරන් තියෙනව. මාව හම්බ වුණ එක දොස්තර සංගම් නායකයෙක් මා ඉදිරිපත් කළ කරුණුවලින් ලොකු හැඟීමකට ආ බව මට පෙනුනා. ඒ වගේ හැමෝම මේ ගැන හිත යොමු කරන්න වෙනව. දුම්රිය

ඉංජිනේරු රියදුරු සංගම් පවා මේ ගැන හිත යොමු කළ යුතුයි. දැන් මේ රාජ්‍ය සේවය කියන එක උසාවිය අර්ථ දක්වන්නේ රජය සමග සම්බන්ධ සියළු ආයතන අළලායි. ඒ අනුව රජයේ බැංකුවල නිළධාරීන්ට විරුද්ධවත් මූලික අයිතිවාසිකම් පෙත්සම් දමන්න පුලුවන් වෙනව. ඒ විතරක් නෙවෙයි රජයේ ආයතනයක් සමඟ මූල්‍ය සම්බන්ධකම් ඇති ඒවාට සේවා සැපයීමක් කරන ආයතන සේවකයිනුත් රජයේ ඒජන්තයන් බවට පත්වෙනව. මේ විදියට ගත්තොත් ලංකාවේ වැඩකරන ජනතාවගෙන් නැත්නම් සේවකයින්ගෙන් විශාල කොටසක් මූලික අයිතිවාසිකම් පෙත්සම්වල වගඋත්තරකරුවන් වෙන්නට පුළුවන්.

ඒත් මේ විදියට බලය යොදලා විභාග පරීක්ෂකවරු දැඩි අසහනයකට හා වෛරයකට තල්ලු කරල ඒ වගේ වැදගත් සේවයක් කරගන්න පුළුවන්ද? බල කරල විනිශචයකාරවරුන්ට නඩු අහන්න කියන්න පුළුවන්ද? එහෙම අහන නඩුවිභාග කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු වගේ වෙන එක නවත්වන්න පුළුවන්ද? වරදකරු වෙනුවට කොහෙවත් යන අහිංසකයෙක් ගස් යන තීන්දු එන්න පුළුවන්. ඒ වගේම විභාග විනිශ්චයත් බලෙන් අසහනයෙන් කරවා ගන්න බෑ. එවැනි විභාග ප්‍රතිඵලයක් ගැන විශ්වාසය තියන්නත් අමාරුයි. වෛරයෙන්, හිතේ අසහනයෙන් බලහත්කරයට යටත්ව වැඩකරන එක හොඳ එකා පහළ දමල, බැරි එකා සමත් කරන්නටත් ඉඩ තියෙනව. විභාග කොමසාරිස් හිතන්නේ උත්තරපත්‍ර බලන එක පාරේ පස් කපනව වගේ වැඩක් කියලද? එහෙම හිතනව නම් ඒ කොමසාරිස්ට පස් කපන එකවත් හරියට කරන්න පුළුවන්ද කියල ප්‍රශ්නයක් එනව.

කොහොමටත් මේ විදියට ගුරු සංගම් වුණත් යට කරගෙන ඉන්න පුළුවන් කියල මං හිතන්නේ නෑ. මේක දිග්ගැසුන යුද්ධයක් බවට පත්වේවි. රජයේ සේවකයෝ හැම කෙනෙකුටම මෙයට මුහුණ දෙන්නට වෙනව අනිවාර්යයෙන්ම. "මහ සටනක් ළඟ එනවා, ඒකට අපි සැරසෙනවා" කියලා මැයි දිනේ කෑගහපු අයට ඒක සටන්පාඨයක් විතරක් නෙවෙයි කියල දැන් තේරෙනවා ඇති.